මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

**තනතුරු නාමය** : Help Desk Operator

**තනතුරු සංඛ්‍යාව** : තනතුරු 03

**පත්වීමේ ස්වභාවය** : කොන්ත්‍රාත් පදනම මත එක් අවුරුද්දක කාලයක් සඳහා බඳවා ගනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත ය.

**වැටුප** : සියළු දීමනා සහිතව රු.45000.00

**වයස** : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි

**සුදුසුකම් :**

- අධ්‍යාපන

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I. සිංහල/ දෙමළ
II. ගණිතය
III. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්යභාරය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක්)

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර(04)කට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වර විෂයයන් හය(06)කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක්(සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම

- තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්:-

තනතුරෙහි කාර්යභාරයට අදාළ වන විෂය ක්ෂේත්‍රයේ මාස 03 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම.

**වෙනත් සුදුසුකම් :**

සෑම අයදුම්කරුවෙකුම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
III. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතු ය.

**තනතුරට පැවරෙන කාර්යයන් :**

❖ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට පැමිණෙන අමුත්තන්, මහජනතාව සහ රජයේ නිළධාරීන්ගේ අවශ්‍යතා විමසා බලා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම

- ❖ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය හා එමගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධයෙන් වාචිකව දුරකථන මගින් හෝ ඊ-මේල් වැනි මාධ්‍යකින් සිදු කෙරෙන විමසීම්වලට පැහැදිලි හා නිවැරදි පිළිතුරු ලබා දීම මගින් කාර්යක්ෂම සේවයක් ඉටුකිරීම

- ❖ පිළිගැනීමේ කවුළුවේ ස්ථාපිත කර ඇති දුරකථන පුවරුව මනා ලෙස හැසිරවීම හා නඩත්තු කිරීම සහ යාවත්කාලීන දුරකථන නාමාවලි පවත්වාගෙන යාම

- ❖ තනතුරට ආදාළව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිළධාරියකු විසින් පවරනු ලැබිය හැකි වෙනත් කාර්යයන්

**බඳවාගැනීමේ ක්‍රමය :**

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

ආදර්ශ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවි වලට පිවිසීමෙන් බාගත කර ගත හැකිය.
https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies/section/current%20vacancies
https://www.wbb.gov..lk/web/si/jobs

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.11.22 දින හෝ එදිනට පෙර **කොමසාරිස්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, පළමු මහල, නව ගොඩනැගිල්ල, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, කොළඹ 01** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් භාරදීමට හෝ wbb.commisioner.vacancy@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමුකළ හැකිය. පමා වූ, අසම්පූර්ණ හෝ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනෙන් පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

තවද, අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙම පුවත්පත් දැන්වීම අවලංගු කිරීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

**කොමසාරිස්**
**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය**
**පළමු මහල, නව ගොඩනැගිල්ල**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**
**කොළඹ 01**